Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# රජය විසින් ඉදිරිපත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධිත විසි දෙවන සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි ප්‍රකාශය

**වර්ෂ 2022 අගෝස්තු 18:** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසි දෙවන සංශෝධන පනත් කෙටුම්පත (පනත් කෙටුම්පත) ප්‍රකාශයට පත් කිරීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ස්වකීය අවධානයට ලක් කරනු ලබයි [වර්ෂ 2022 ජූලි 29 වන දින නිකුත් කරන ලද ගැසට් පත්‍රයෙහි දෙවන කොටස. 2022 අගෝස්තු 2 වන දින නිකුත් කළ අතිරේකය]. මෙම පනත් කෙටුම්පත වර්ෂ 2022 අගෝස්තු 10 වැනි දින පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ද ඇතුළත් කරන ලදී. විසි දෙවැනි සංශෝධනය ලෙස ගැසට් කර ඇති මෙම පනත් කෙටුම්පත සම්මත කළහොත් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිඑක්වන සංශෝධනය බවට පත්වනු ඇත.

මෙය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ (Sri Lanka Podujana Peramuna - SLPP) - එක්සත් ජාතික පක්ෂ (United National Party - UNP) ආණ්ඩුව විසින් ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පතේ දෙවන පුනරාවර්තනයයි. පනත් කෙටුම්පතේ පෙර අනුවාදය කිසිදු අවස්ථාවක පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකළ අතර එය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඇතුළු බොහෝ දෙනාගේ විවේචනයට ලක් විය.

මෙම පනත් කෙටුම්පත මගින් එහි ඊට පෙර අනුවාදයේ ඇති ගැටළු කිහිපයක් ආමන්ත්‍රණය කරනු ලබන අතරම, එය ශ්‍රී ලංකාවේ ජනතාවගේ ඉල්ලීම්වලට අනුගත නොවන අන්දමට ජනාධිපතිවරයාගේ බලතල අඩු කිරීමක් සිදු නොකරන අතර එමගින් කිසිදු අන්දමක අර්ථවත් ආකාරයකින් සංවරණ හා තුලන තත්ත්වයක් හඳුන්වා නොදෙන බවද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙහි දී සටහන් කරනු ලබයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පනත් කෙටුම්පතේ අන්තර්ගතය හොඳින් සලකා බලා ඇති අතර, පනත් කෙටුම්පත ඔස්සේ දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සහ විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ දුර්වලම අංගයන්ගෙන් අදාළ විධිවිධාන උපුටා ගෙන ඇති බව මෙහි දී සටහන් කර සිටී. යම් හෙයකින් එය සම්මත වී ක්‍රියාත්මක කළ හොත්, එය වඩාත් ඉහළ මට්ටමේ වගවීමක් සහිත සහ විනිවිදභාවයකින් යුත් රජයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් වන පුරවැසියන්ගේ ගැටලුවලට විසඳුම් නොදෙන ආණ්ඩු ක්‍රමයක් පිහිටුවනු ඇති සේම දිගුකාලීන වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන සහ එකී ආයතනයන් කෙරෙහි පුරවැසියන්ගේ විශ්වාසය තවදුරටත් අවතක්සේරුවට ලක් වීමට එය හේතු වනු ඇත.

මෙම පනත් කෙටුම්පතේ බරපතළ ගැටලු කිහිපයක් තිබේ. පනත් කෙටුම්පතේ පෙර අනුවාදයේ මෙන්ම, මෙම අනුවාදයේ ද, යෝජිත ව්‍යවස්ථාදායක සභාවේ (සභාවේ) සංයුතිය දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පැවති තත්ත්වයට වඩා සැලකිය යුතු ලෙස දුර්වල මට්ටමකට පත් කර ඇත.

ව්‍යවස්ථාදායක සභාවේ යෝජිත සංයුතිය ආණ්ඩුවට හිතකර වන අතර එහි සාමාජිකයින් 10 දෙනාගෙන් 7 දෙනෙකු පාලනය කිරීමට හෝ ඔවුන්ට බලපෑම් කිරීමට ආණ්ඩුවට හැකියාව ලැබේ. මේ අනුව බලන විට, ව්‍යවස්ථාදායක සභාව වූ කලී හුදෙක් විසිවන ආණ්ඩුක්‍ර ව්‍යවස්ථා සංශෝධනය යටතේ පවතින පාර්ලිමේන්තු සභාවෙහිම යම් ආකාරයක පුළුල් කළ තත්ත්වයක් පමණක් බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ අදහස වේ. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවීමේ මූලික අභිප්‍රාය වූයේ රාජ්‍ය පාලනය දේශපාලනීකරණයෙන් වියුක්ත කිරීම වන අතර ඒ සඳහා ක්‍රම ද්විත්වයක් ඇතුළත් විය: ඉන් එකක් වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ බහුතර නියෝජනයක් දේශපාලඥයින් නොවන තැනැත්තන් සඳහා සහතික කිරීම වන අතර අනෙක් කරුණ වූයේ දේශපාලනික පසුබිමකින් ඇතුළත් වන සාමාජිකයන් කෙරේ ඇති ආණ්ඩුවේ ආධිපත්‍යය ඉවත් කිරීමයි. එසේ වුවද, වර්තමාන පනත් කෙටුම්පතේ යෝජනා කර ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය එම අරමුණු කිසිවක් සාක්ෂාත් කර නොගන්නා අතර ඒ වෙනුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හරහා පත්වීම් ලබා දෙන ආයතනවල ස්වාධීනත්වය ද අවතක්සේරුවට ලක් කරනු ලබයි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතරින් අමාත්‍යවරුන් (කැබිනට් සහ කැබිනට් නොවන) පත් කිරීමට ජනාධිපතිවරයා සතු බලතල වෙනස් කර ඇත. කෙසේ වෙතත්, අමාත්‍යවරුන් සහ අමාත්‍යාංශ සංඛ්‍යාව තීරණය කිරීම සහ එම අමාත්‍යාංශවලට විෂයයන් සහ කාර්යයන් පැවරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සතු ස්වකීය අභිමත බලයේ කිසිදු වෙනසක් සිදු කර නොමැත. තවද, ජනාධිපතිවරයාට තම අභිමතය පරිදි සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් පත් කිරීමට හැකියාව ලැබේ. මෙමගින් නැවතත් ජනාධිපති කාර්යාලයට සංකේන්ද්‍රණය වී ඇති විධායක බලය ආරක්ෂා වේ. ජනාධිපතිවරයා ආරක්ෂක අමාත්‍යාංශය දරණ බවත් අගමැතිවරයාගේ උපදෙස් මත ඔහුට වෙනත් ඕනෑම අමාත්‍යාංශයක් පවරා ගැනීමට කටයුතු කළ හැකි බවත් මෙම සංශෝධන පනත් කෙටුම්පතේ සඳහන් වේ. මේ අනුව, සමස්ථයක් වශයෙන් විමසා බලන විට, විධායක ජනාධිපතිවරයා වෙත බලතල සංකේන්ද්‍රණය වීම සම්බන්ධයෙන් පවතින ගැටලුව ආමන්ත්‍රණය කිරීම මෙම යෝජිත පනත් කෙටුම්පත හරහා ඉතා අල්ප වශයෙන් පමණක් සිදු වන බව පෙනේ.

මෙම පනත් කෙටුම්පත මගින්, පත් කරනු ලැබිය හැකි කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව 30 කට සහ කැබිනට් නොවන අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් සංඛ්‍යාව 40 කට සීමා කරනු ලබයි. මෙම සංඛ්‍යාව දැනටමත් ඉතා ඉහළ මට්ටමක පවතින නමුත්, 'ජාතික ආණ්ඩු' සම්බන්ධයෙන් දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අත්‍යවශ්‍ය නොවන විධිවිධාන මෙම යෝජිත පනත් කෙටුම්පතෙහි එලෙසම අන්තර්ගත අතර එමගින් ආණ්ඩුවට උක්ත කී සංඛ්‍යාත්මක සීමාවන් ඉක්මවා ගොස් කැබිනට් හා කැබිනට් නොවන අමාත්‍යවරුන් ඕනෑම ප්‍රමාණයක් පත් කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසේ.

වඩාත් පුළුල් අන්දමට විමසා බැලීමේ දී, මෙම පනත් කෙටුම්පත ඔස්සේ පිළිබිඹු වන්නේ ශ්‍රී ලංකාව පුරා පුළුල් ලෙස පැවති මහජන විරෝධතාවලින් කූටප්‍රාප්තියට පත් වූ රාජ්‍ය පාලන ක්‍රමය පිළිබඳ පවතින මහජන අපේක්ෂා භංගත්වය තේරුම් ගැනීමට අපොහොසත් වීමයි. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු - එක්සත් ජාත්ක පක්ෂ ආණ්ඩු විසින් ඉදිරිපත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ යෝජනා වල මෙය එක්තරා රටාවක් බව විද්‍යමාන වේ. මෙම යෝජනා ඔස්සේ ශ්‍රී ලංකාව පීඩාවට පත්වී ඇති රාජ්‍ය පාලන අර්බුදයට සැබෑ ලෙසම විසඳුම් සෙවීමට උත්සාහ කරනවාට වඩා දේශපාලනඥයන් කිහිප දෙනෙකුගේ සහ දේශපාලන පක්ෂවල දේශපාලන අභිලාෂයන් තෘප්තිමත් කිරීම අරමුණු කරගත් ඒවා බව මනාව පැහැදිලි වේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මීට පෙර අවස්ථා කිහිපයකදී ප්‍රකාශ කර ඇති පරිදි, ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ හරහා මෙම පෙර නොවූ විරූ ව්‍යසනයට ඇති එකම සුදුසු ආයතනික ප්‍රතිසංස්කරණ ප්‍රතිචාරය විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන් අහෝසි කර පූර්ණ පාර්ලිමේන්තු ව්‍යවස්ථාපිත ප්‍රජාතන්ත්‍රවාදයකට නැවත පැමිණීමයි. විධායක ජනාධිපති ක්‍රමයේ අසීමිත සහ පාලනය නොකළ බලතල අහෝසි කර ඒ වෙනුවට පාර්ලිමේන්තුවේ නියෝජනය සහතික කරනු ලබන සහ පාර්ලිමේන්තුවට වගකියන කැබිනට් විධායකයක් පත් කර නොගන්නා තුරු වත්මන් ආර්ථික අර්බුදය විසඳීමට අවශ්‍ය තීරණ ගැනීමට නොහැකි වනු ඇත.

මෙකී හේතූන් නිසා, ශ්‍රී ලංකාවේ බිඳවැටුනු ආර්ථික නැවත ප්‍රකෘති තත්ත්වයට පත් කිරීම උදෙසා අත්‍යවශ්‍ය ආයතනික ප්‍රතිසංස්කරණයන්හි කොටසක් විය යුතු මෙම පනත් කෙටුම්පත කිසිදු ආකාරයකින් අර්ථවත් දායකත්වයක් ලබා නොදෙන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය මූලධර්මය සහ ව්‍යවස්ථාමය සැලසුම් යන ද්විත්ව දෘෂ්ඨිකෝණයන්ගෙන්ම බලන විට පැහැදිලි වේ. මෙකී තත්ත්වය ශ්‍රී ලංකාවට සහ ශ්‍රී ලාංකිකයන්ට සැලකිය යුතු සාධනීය බලපෑමක් නොමැති ඇතැමුන් සනසාලීම සඳහා රජය විසින් සංකේතාත්මක ප්‍රතිසංස්කරණ ආරම්භ කරන බව පෙන්වීමට ගන්නා නිරර්ථක උත්සාහයක් බව සටහන් කළ යුතු වේ. මෙම සුවිශේෂී අර්බුදයට පිළියම් යෙදීමට සහ මෙකී තත්ත්වය අනාගතයේ නැවත ඇති නොවීමට වගබලා ගැනීම සඳහා පුළුල් ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත ප්‍රතික්ෂේප කළ යුතුය.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org